# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,246—1964 දෙසැම්බර් 2 වැනි බදාදා—1964.12.2

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී. 31/47.
ප.පා.දෙ.—ජී. 94.

### ගම්සභා ආඥාපනත හා ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 11 වැනි වගන්තියෙන් හා (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් ද තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලනය සහ සවදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය සහ සවදේශ කටයුතු පිළිබඳ ඇමති.

1964 දෙසැම්බර් මස 2 වැනි දින,
කොළඹ දීය.

#### ආඥාව

1. මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් එක් එක් ගම් සභාවේ දැනට නිල දරන සභිකවරුන්ගේ නිල කාලය අවසාන විය යුතු දිනය වශයෙන්, 1965 ජනවාරි 31 වැනි දිනය වෙනුවට, 1966 ජනවාරි 31 වැනි දිනය මෙයින් නියම කරනු ලැබේ.

2. මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් එක් එක් ගම් සභාවට සභිකවරුන් තෝරා පත් කර ගැනීම පිණිස 1965 ජනවාරි 31 වැනි දින හෝ ඊට ප්‍රථම මහා ඡන්ද විමසීමක් පැවැත් වීමේ කාර්‍ය්‍යය සඳහා (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත යටතේ මෙතෙක් කරන ලද සියලුම කටයුතු අවලංගුව හා ප්‍රතිඵල රහිතවී ඇතැයි සැලකිය යුතුය.

3. මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් එක් එක් ගම් සභාවට සභිකවරුන් තෝරා පත් කර ගැනීම පිණිස 1965 ජනවාරි 31 වැනි දින හෝ ඊට පෙර මහා ඡන්ද විමසීමක් පැවැත් වීමේ කාර්‍ය්‍යය සඳහා ප්‍රදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත යටතේ තවදුරටත් ක්‍රියා නොකළ යුතුය.

4. මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් එක් එක් ගම් සභාවේ ඡන්දදායක ප්‍රදේශය පිහිටා තිබෙන දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධාරියා විසින්, 1966 ජනවාරි 31 වැනි දින හෝ ඊට පෙර පැවැත්වීමට නියමිත එකී සභිකවරුන් තෝරා පත් කර ගැනීමේ කාර්‍ය්‍යය සඳහා—

(අ) (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත යටතේ ඒ එක් එක් ප්‍රදේශයේ ඡන්ද කොට්ඨාශ සඳහා ඡන්දදායක ලැයිස්තු පිළියෙල කිරීම තමා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් දිනයක ආරම්භ කළ යුතුය. තවද,

(ආ) දැනට නිල දරන එකී සභිකවරුන්ගේ නිල කාලය අවසාන වීමේ දිනය ගැන සැළකිලිමත්ව, තමා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් දිනයන්හි දී එකී ආඥාපනතේ 22, 26 සහ 38 වැනි වගන්තිවලින් නියමිත කටයුතු කළ යුතුය.

#### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කය

කඹුරුපිටිය ගම් සභාව.

---

ඇල්.ඩී.—බී. 31/47.
ප.පා.දෙ.—ජීබී/15/2/9.

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5(1) වැනි හා 10 වැනි වගන්තිවලින් සහ ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1964 දෙසැම්බර් මස 2 වැනි දින,
කොළඹ දී ය.

#### ආඥාව

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 5(1) වැනි හා 10 වැනි වගන්තිය යටතේ සම්පාදිතව 1964 ජූලි මස 10 වැනි දින අංක 14,102 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ ගඟ බඩ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි කිරින්ද-පුහුල්වැල්ල අලුත් ගම් ප්‍රදේශය සංස්ථාපනය කිරීමේ ආඥාව එහි 2(ආ) ඡේදයෙහි "1965 පෙබරවාරි මස පළමුවැනි දින" යන යෙදුම වෙනුවට "1966 පෙබරවාරි මස පළමුවැනි දින" යන යෙදුම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

1009—ආර් 2474—5,275 (64/12)